# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/03/ACC/8/IMP/2020 | ඔබේ අංකය / உமது இல / Your No: ............................................ | දිනය / திகதி / Date: 2020.05.01 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම බැංකු සමිති කළමණාකරුවන්,

සියළුම සමාජ සංවර්ධන සහකාරවරුන්.

**<u>උද්ගතවී ඇති ව්‍යවසනකාරි තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛණගත කර ඇති ප්‍රතිලාභන් සඳහා රු.5,000/- ක දීමනාවක් ලබාදීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් කාන්තා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MWCA & SS/NSPD/07/01/01 දරණ 2020.04.30 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය හා ජාතික ආබාධිත තැනැත්තන් සඳහා වු මහලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛණගත වැඩිහිටි තැනැත්තන්, ආබාධිත හා වකුගඩු රෝගීන් සඳහා රු.5,000/- ක එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාවක් ලබාදිමට ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් උපදෙස් හා මහපෙන්වීම ලබාදී ඇත. එම උදෙස් පරිදි කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය විසින් අදාල දීමනාව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි බැංකු සමිති මගින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

03. එහෙයින් අදාල ප්‍රතිලාභ ගෙවීමට අවශ්‍ය මුදල් මේ වනවිටත් සියළුම සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති වල නිල බැංකු ගිණුමට (ජංගම ගිණුමට) බැර කර ඇත. එම මුදල් සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති කළමණකාරු විසින් බැංකු ගිණමෙන් ඉවත් කර ගෙවීම් කටයුතු සඳහා අදාල නිලධාරින් වෙත ලබාදීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මුදල් අයකැමි (සරප්) වෙත බාරදි පොදු 172 මුදල් භාරදීමේ කුවිතාන්සියක් ලබාගත යුතුය. එම මුදල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සේප්පුවේ තබා අවස්ථානුකූලව ගෙවීම් කටයුතු සඳහා ගෙවිම් කරනු ලබන නිලධාරින් වෙත බාරදිය යුතු අතර, මුදල් ලබාගත් බවට පොදු 36 (අ) ආකෘතියෙන් අත්සන් ලබාගත යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

04. අදාල ගෙවීම් කටයුතු පහත සඳහන් නිලධාරීන් මඟින් ප්‍රතිලාභීන්ගේ නිවසට ගොස් බාරදී අත්සන් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

i. සමෘද්ධි සමාජ සංවර්ධන සහකාර (සමෘද්ධි බැංකු සමිතිය)

ii. සමාජ සේවා නිලධාරී ( ප්‍රාදේශිය ලේකම් කාර්යාලය)

iii. වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරී (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

iv. වසම භාර ග්‍රාම නිලධාරී

05. ගෙවීම සිදුකර අවසන්වූ පසු අදාල ලේඛණ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සුරක්ෂිතව තබා ගත යුතු අතර, ඉතිරි මුදල වෙතොත් එම මුදල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල ලංකා බැංකුවේ සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල බැංකු ගිණුමට (ජංගම ගිණුම) බැර කර තැන්පතු රිසිට්පත ෆැක්ස් අංක 011-2889004 / 0112889002 එවිය යුතුය.

06. ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කටයුතු සඳහා සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිතියට ලබා දෙන මුදල් පහත පරිදි ගිණුම් ගත කල යුතුය.

මුදල් ලැබීම

| | | |
|---|---|---|
| මුදල් ගිණුම ( නිල බැංකු ගිණුම ) | | හර |
| (9417) විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද අරමුදල් ගිණුම | බැර | |

මුදල් ආපසු ගැනීම

| | | |
|---|---|---|
| (9417) විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද අරමුදල් ගිණුම | හර | |
| මුදල් ගිණුම ( නිල බැංකු ගිණුම ) | | බැර |

07. සියළුම ගෙවීම් වලට අදාල ප්‍රගතිය සමාජ සේවා නිලධාරී හා වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරී විසින් ඒකාබද්ධ වාර්තාවක් ලෙස සකස් කර ප්‍රාදේශිය ලේකම් අනුමැතියයෙන් ලබා දීමට කටයුතු කල යුතුය.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක
ප්‍රධාන ගණකාධිකාරී

පිටපත් :-

01. ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂන අමාත්‍යාංශය - දැ.ගැ.ස

02. අධ්‍යක්ෂ - ජාතික වැඩිහිටි ලේකම්කාර්යාලය - අ.ක.ස

03 අධ්‍යක්ෂ - ආබාධිත තැන්තන් සඳහා වු මහ ලේකම් කාර්යාලය - අ.ක.ස